**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2019

**11 ශ්‍රේණිය** **ශිල්ප කලා - I** **කාලය පැය 3 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය සපයා ඇති පිළිතුරු පත්‍රයේ කතිරයකින් සටහන් කරන්න.

---

01. ජනකලාවන් ලෙස ඇරඹී අද මහා පරිමාණ කර්මාන්තයක් බවට පත් ව ඇති කර්මාන්තය කුමක්ද?
(1) ලාක්ෂා කර්මාන්තය (2) පන්පැදුරු කර්මාන්තය
(3) මැටි කර්මාන්තය (4) බීරළු කර්මාන්තය

02. විහිත චතුරස්‍ර යුගලය භාවිතයෙන් ඇඳිය හැකි කෝණ ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) 150°, 180°, 105°, 75° (2) 30°, 60°, 120°, 90°
(3) 75°, 100°, 130°, 40° (4) 50°, 60°, 70°, 100°

03. 


පහත රූපසටහනින් දැක්වෙන්නේ ඉලිප්සයකි. එහි F අක්ෂරයේ දක්වා ඇත්තේ,
(1) මධ්‍ය ලක්ෂයයි. (2) චාපයයි.
(3) නාභිදුරයි. (4) සුළු අක්ෂයයි.

04. රූපයේ දැක්වෙන්නේ ලියුම් කවරයක රූපීය පෙනුමකි. එහි විනසනය කළ විට ලැබෙන හැඩතලය වන්නේ,





(1) (2) (3) (4)

05. චතුස්තලයක එකිනෙකට සම්මුඛව පිහිටි ශීර්ෂ හෙවත් කෝණික ලක්ෂ දෙකක් යා කෙරෙන සරල රේඛාව හඳුන්වන්නේ,
(1) විකර්ණය වශයෙනි. (2) ලම්භකය වශයෙනි.
(3) සමච්ඡේදනය වශයෙනි. (4) කේන්ද්‍රික ඛණ්ඩය වශයෙනි.

06. පින්සල් අංක යොදා ඇත්තේ එහි ඇති කෙඳි ප්‍රමාණය අනුවය. 00 - 03 දක්වා සියුම් පින්සල් වඩාත් සුදුසු වනුයේ,
(1) සායම් ගැල්වීම හා මිශ්‍ර කිරීමට ය. (2) තිත්, ඉරි, ඉම් රේඛා ඇඳීමට ය.
(3) විශාල ප්‍රදේශ වර්ණ ගැන්වීමට ය. (4) මහත රේඛා ඇඳීමට ය.

07. රූපයේ දැක්වෙන්නේ ABC සමපාද ත්‍රිකෝණයකි. එහි කෝණ සමච්ඡේදනය සඳහා සුදුසුම උපකරණය කුමක්ද?
(1) බෙදුම් කටුව (2) විහිත චතුරස්‍ර යුගලය
(3) කවකටුව (4) අඩිරූල



08. පහත ලක්ෂණ ඇතුලත් චතුරස්‍රය වන්නේ,

- පාද සමාන වන අතර සම්මුඛ කෝණ සමාන වේ.
- විකර්ණ අසමාන නමුත් එකිනෙක ඍජු කෝණිව සමච්ඡේදනය කරයි.
- සම්මුඛ පාද සමාන්තර වේ.

(1) ත්‍රපීසියම (2) රොම්බසය (3) රොම්බාගය (4) සමචතුරස්‍රය

09. සිලින්ඩරයක විකසනය ඇඳීමේදී විකසන රේඛාවේ දිග සමාන වන්නේ,

(1) වෘත්තයේ පරිධියට ය. (2) වෘත්ත්යේ අරයට ය.

(3) වෘත්තයේ විශ්කම්භයට ය. (4) වෘත්තයේ ජ්‍යායටය.

10. පතුල සවිධි ෂඩාස්‍රාකාර හැඩැති පහන් ආවරණයක දළ රූප සටහනක් පහත දැක්වේ. මේ සඳහා යොදාගත් ත්‍රිකෝණ හැඩ හයකි. එම ත්‍රිකෝණ වන්නේ,



(1) සමපාද ත්‍රිකෝණ (2) සම ද්විපාද ත්‍රිකෝණ

(3) විෂම පාද ත්‍රිකෝණ (4) මහා කෝණි ත්‍රිකෝණ

11. සිවුරු පඬු පෙවීමේදී වර්ණ හොඳින් තහවුරු කිරීම සඳහා තැම්බීම කළ යුතුය. මේ සඳහා පරිසරයෙන් ලබා ගන්නා ශාක වර්ගය වන්නේ,

(1) කොහොඹ කොළය. (2) කොස් කොළය. (3) බෝම්බු කොළය. (4) ගස්ලබු කොළය.

12. සේද කෙඳි වල තිබෙන සෙරසින් නමැති මැලියම් විශේෂය ඉවත් කිරීම සඳහා කළ යුතු කාර්යය වන්නේ,

(1) පැය 02 ක් පෙඟවීමට තබා සෝදා හැරීම ය.

(2) සෝඩියම් හයිඩ්‍රොසල්ෆයිඩ් මිශ්‍රණයේ තබා සෝදා හැරීමය.

(3) උෂ්ණත්වය 40°C 50°C අතර කාලයක් තම්බා සෝදා හැරීම ය.

(4) සබන් ද්‍රාවණයක පැය 02 ක් තම්බා පිරිසිදු ජලයෙන් සෝදා හැරීම ය.

13. වෙළෙඳපොළෙන් පින්සලක් මිලදී ගැනීමේදී වඩාත් සැලකිලිත් විය යුතු කරුණක් වන්නේ,

(1) පින්සලයේ ඝනකම හා මිල පිළිබඳව ය. (2) පින්සලයේ කෙඳි ඝනකම පිළිබඳව ය.

(3) පින්සලයේ ඝනකම හැඩය පිළිබඳව ය. (4) පින්සලයේ හැඩය හා අංකය පිළිබඳව ය.

14. නිර්මිත අච්චුවක් සකස් කිරීමේදී භාවිතා කරන ක්‍රම අතරින් නිවැරදි ක්‍රමය දැක්වෙන රූප සටහන තෝරන්න.



(1) (2) (3) (4)

15. රෙදි විවීමට අමතරව කෙඳි භාවිතා කරමින් විවිධ නිෂ්පාදන සිදුකරයි. කඹ, සෙල්ගාර ලණු හා යොත් සෑදීමට භාවිතා කරන ශාක වර්ගය වන්නේ,

(1) සිසල් ය. (2) පෙනා ය. (3) මැනිලා ය. (4) නියඳ ය.

16. අන්වීක්ෂීය පරීක්ෂාවේදී පහත දැක්වෙන පෙනුම පෙන්නුම් කරන්නේ කුමන කෙඳි වර්ගයේ ද?



(1) විස්කෝස් ය. (2) ලෝම ය.

(3) නයිලෝන් ය. (4) සේද ය.

17. හැඩ පෙති ආධාරයෙන් පටියක් වියා ගැනීමේදී භාවිතා කළ හැකි නූල් වර්ග සහිත පිළිතුරු කාණ්ඩය තෝරන්න.
(1) ශක්තිමත් කපු නූල්, මැක්‍රම් නූල්, සෙල්ගාර නූල් ය.
(2) ශක්තිමත් කපු නූල්, නයිලෝන් නූල්, තංගුස් නූල් ය.
(3) නයිලෝන් නූල්, තංගුස් නූල්, මැහුම් නූල් ය.
(4) මැහුම් නූල්, නයිලෝන් නූල්, සෙල්ගාර නූල් ය.

18. ඉස්ත්‍රික්කයක් ආධාරයෙන් රත් කළ අලවා ගැනීම මගින් මෝස්තර නිර්මාණය කර ගන්නා අලංකාර ක්‍රමය හඳුන්වන්නේ,
(1) සීමාන්තර මෝස්තර ලෙස ය. (2) තිර රාමු මෝස්තර ලෙස ය.
(3) සායම් ආලේපන මෝස්තර ලෙස ය. (4) තාප බන්ධිත මෝස්තර ලෙස ය.

19. අංක $20^s$ තනිපට නූලක් දෙපට අඹරාගත් විට එහි අංකය $2/20^s$ වේ. ඒ අනුව කිලෝ ග්‍රෑම් 1 ට අල්ලන නූල් කැරලි ගණන කීයද?
(1) 20 කි. (2) 15 කි. (3) 10 කි. (4) 5 කි.

20. කමිස රෙදි හැදයක දිග මීටර් 50 ක් ද, පළල සෙන්ටිමීටර් 90 ක් ද සෙන්ටිමීටර් 10 දික් නූල් 30 ක් ද වේ. මෙම හාදයට අවශ්‍ය දික් නූල් පොටවල් ගණන සොයන්න.
(1) 2700 කි. (2) 1000 කි. (3) 2250 කි. (4) 1500 කි.

21. විවීමේ යන්ත්‍රයක විවිධ වූ කාර්යයන් ඉටු කිරීම සඳහා විවිධ වූ කොටස් යොදා ගනී. පහත දැක්වෙන උපකරණය හඳුන්වන්නේ,



(1) ලීවරය (2) බොබින් එක ය.
(3) පර්න් එකය. (4) පනාව ය.

22. අත් යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනයේදී දික් නූල් එතීම සඳහා භාවිතා කරන උපකරණ කට්ටලය තෝරන්න.
(1) හැඩනූල් කූර, මල්වක්‍රය, නාස්කුම් කූරය (2) දික්නූල් කූර, එතුම් රෝදය හා මල් වක්‍රය
(3) දික් නූල් කූර, නූල් බෙත්ම, මල් වක්‍රය (4) එතුම් රෝදය, හැඩ නූල් කූර, පනාව

23. පහත වියමන් රටා අතරින් තුඩු හිරී වියමන් රටාව තෝරන්න.

(1)  (2)  (3)  (4) 

24. ශ්‍රී ලංකාවේ ඉතා ප්‍රසිද්ධ බෝල මැටි නිධිය පිහිටා ඇත්තේ කොහේද?
(1) මීටියාගොඩ ය. (2) දෙදියවල ය. (3) බොරලැස්ගමුව ය. (4) අළුත්නුවර ය.

25. 'ක්වාට්ස්' යනුවෙන් හඳුන්වන්නේ මොනවාද?
(1) තිරිවානා ගල් ය. (2) ඩොලමයිට් ය. (3) සිලිකා වැලි ය. (4) ග්‍රොග් ය.

26. තෙත් කලාපීය මැටි නිධි පිහිටි ස්ථාන සහිත පිළිතුර තෝරන්න.
(1) කැලණි ගඟ හා කළු ගඟ ය. (2) කැලණි ගඟ හා ගල් ඔය ය.
(3) අනුරාධපුර හා බංගදෙණිය ය. (4) ගල්ඔය හා ඔඩ්ඩුසුඩාන් ය.

27. මැටි වලින් තැනූ භාණ්ඩයක් වියළීමෙන් හා පිළිස්සීමෙන් පසු භාණ්ඩයේ පරිමාව අඩු වීම හඳුන්වනු ලබන්නේ,
(1) සුවිකර්යතාව ය. (2) සවිවරතාව ය. (3) හැකිළීම ය. (4) වර්ණ ය.

28. ඉතා අධික උෂ්ණත්වයකට ඔරොත්තු දීමේ හැකියාව ඇති මැටි වර්ගය වන්නේ,
(1) රතු මැටි ය. (2) ගිනි මැටි ය. (3) බෝල මැටි ය. (4) කෙඔලින් මැටි ය.

29. මැටි වල අඩංගු සංඝටක සහිත පිළිතුර තෝරන්න.
(1) ඇලුමිනියම් ඔක්සයිඩ්, සිනික් ඔක්සයිඩ් ය. (2) ඇලුමිනා සිලිකේට්, කාබන් ඩයොක්සයිඩ් ය.
(3) පොස්පරස්, සිලිකන්ඩයොක්සයිඩ් ය. (4) ඇලුමිනියම් ඔක්සයිඩ්, සිලිකන් ඩයොක්සයිඩ් ය.

30. සංකීර්ණ අච්චුව භාවිතයෙන් නිෂ්පාදනය කළ හැකි භාණ්ඩයකි.
(1) පීරිසියක් ය. (2) දීසියක් ය. (3) අඩු නැති කෝප්පයක් ය. (4) කේතලයක් ය.

31. ද්විතියික පිළිස්සීම කරනු ලබන මැටි භාණ්ඩය කුමක්ද?
(1) වළං ය. (2) ගුරුලේත්තු ය. (3) පෝසිලේන් භාණ්ඩ ය. (4) කාසි කැට ය.

32. ස්වභාවික මල් භාවිතයේ ඇති වාසියක් වන්නේ මින් කුමක්ද?
(1) කල්තබා ගත හැකි ය. (2) නැවුම් සුවඳක් ඇත.
(3) කීපවිටක් භාවිතා කළ හැකිය. (4) ප්‍රවාහනය පහසු ය.

33. ආභරණ සාදා ඉතිරි වූ ක්ලේ මිශ්‍රණ කල්තබා ගැනීම සඳහා ඔබට කළ හැකි කාර්යය කුමක්ද?
(1) අව්වේ තැබීම ය. (2) පියනකින් වසා තැබීම ය.
(3) වතුර එකකට දමා තැබීම ය. (4) පොලිතින් කොළයක ඔතා ශීතකරණයේ තැබීම ය.

34. පහත සඳහන් මල් සැකසුම් වල හැඩය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.



(1) දිගටි හැඩය, අශ්වලාඩම් හැඩය, අයිඩ්‍රොප් හැඩය
(2) පෝසි හැඩය, දිගැටි හැඩය, අශ්වාලඩමක හැඩය
(3) දිගටි හැඩය, අශ්වලාඩමක හැඩය, පෝසි හැඩය
(4) පෝසි හැඩය, අයිඩ්‍රොප් හැඩය, හදවත් හැඩය.

35. සැහැල්ලු සෙල්ලම් සතුන් නිර්මාණයේදී ටෙඩි බෙයාර් සෑදීමේදී නියම වලසකුගේ පෙනුම ලබාගැනීමට භාවිතා කළ හැකි සුදුසු රෙදි වර්ගය වන්නේ,
(1) වෙල්බෝවා රෙදි ය. (2) ලොම් සහිත රෙදි ය.
(3) පොලියෙස්ටර් රෙදි ය. (4) නයිලෝන් රෙදි ය.

36. රෙදි බෝනික්කකු නිර්මාණය කිරීමට යොදා ගන්නා මැහුම් ක්‍රම 03 වන්නේ,
(1) පිස්මේන්තු මැස්ම, බ්ලැන්කට් මැස්ම, ලේසි ඩේසි මැස්ම ය.
(2) දම්වැල් මැස්ම, හුරුළු කටු මැස්ම, නැටි මැස්ම ය.
(3) පිස්මේන්තු මැස්ම, දම්වැල් මැස්ම, නැටි මැස්ම ය.
(4) නැටි මැස්ම, හුරුළු කටු මැස්ම, ලේසිඩේසි මැස්ම ය.

37. සැහැල්ලු සෙල්ලම් සතුන් නිර්මාණයේදී පිරවුම් සඳහා යොදා ගන්නා සුදුසු මාධ්‍ය වන්නේ,
(1) පැඩින් ය. (2) පුළුන් ය. (3) ලී කුඩු ය. (4) රෙදි කැබලි ය.

38. කඩදාසි වලින් සාදාගන්නා මල් කල් පවත්වා ගැනීම සහ ශක්තිමත් බව ඇති කර ගැනීම සඳහා භාවිතා කරන්නේ මොනවාද?
(1) මී ඉටි ගැල්වීම ය. (2) පාරපින් ඉටි ගැල්වීම ය.
(3) රට දුම්වල ගැල්වීම ය. (4) බයිඩර් ගම් ගැල්වීම ය.

39. වර්තමානයේ උද්‍යාන නිර්මාණය කිරීමේදී කල්පැවැත්ම සහ ඉහළආදායමක් ලබා ගැනීමට යොදාගන්නා මාධ්‍යයක් වන්නේ,
(1) ලෝහ ය. (2) කළුගල් ය. (3) සිමෙන්ති ය. (4) දැව ය.

40. මූර්තියක් නිර්මාණයේදී හැඩතල වල පරිමාව නියමිත ප්‍රමාණවල යොදා ගැනීම හඳුන්වන නම කුමක්ද?
(1) සමබරතාවය (2) තෝරාගත් ස්ථානය
(3) අනුපාතයට තැබීම (4) විවිධත්වය

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

**11 ශ්‍රේණිය** **ශිල්ප කලා - II** **කාලය පැය 2 යි**

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) පරාක්‍රමබාහු මහා විද්‍යාලයේ වර්ෂ අවසාන ප්‍රදර්ශනය සඳහා විදුහලේ ශිල්ප කලා හදාරන සිසුන් භාණ්ඩ රාශියක් සකස් කර තිබුණි. ප්‍රදර්ශන කුටි වලට විවිධ ක්ෂේත්‍රයන් සඳහා ජයග්‍රහණ රාශියක් ලබා දීමට අවස්ථා සැලසුම් කර තිබුණි.

i. පිවිසුම් දොරටුව අසල ඉදි කළ තොරණ සඳහා භාවිතා කර තිබුණු පරිසර හිතකාමී ද්‍රව්‍ය 02 ක් ලියන්න.

ii. මෙම ප්‍රදර්ශනයේ ආරාධිත අමුත්තන් සඳහා විශේෂ ආරාධනා පත් පිළියෙල කර තිබුණි. ඒ සඳහා භාවිතා කර තිබූ දේශීය අමු ද්‍රව්‍ය 02 ක් ලියන්න.

iii. ප්‍රදර්ශනයේ පිවිසුම් දොරටුවට නුදුරින් දිය ඇල්ලක් සහිත පොකුණක් ඉදිකර තිබුණේ ශිල්පකලා හදාරන සිසුන් විසිනි. එයට භාවිතා කර තිබූ අමු ද්‍රව්‍ය 04 ක් නම් කරන්න.

iv. ආරාධිත අමුත්තන් කැඳවාගෙන යෑමට අලංකාර නැටුම් කණ්ඩායමක් පුහුණු කර තිබුණි. එම කළ ගෙඩි නැටුමේ කළගෙඩි අලංකාර කිරීමේ ක්‍රම දෙකක් ලියන්න.

v. නැටුම් කණ්ඩායමේ ඇඳුම් අලංකාර කර තිබුණේ ද ශිල්ප කලා අංශයේ සිසුන් විසින් ම ය. රෙදි පිළි අලංකරණ ක්‍රම 04 නම් කරන්න.

vi. පොල්තෙල් පහන දැල්වීම උත්සව ආරම්භයේ දී කරනු ලබන සිංහල චාරිත්‍රයකි. පොල්තෙල් පහන පා මුල ධාන්‍ය බීජ මගින් අලංකාර කර තිබුණි. ඒ සඳහා යොදාගත හැකි හැඩතල 02 ක් නම් කරන්න.

vii. නිවේදන පුවරුව විචිත්‍රවත් කිරීම සඳහා යොදාගත හැකි සැරසිලි මාධ්‍යයන් 02 ක් නම් කරන්න.

viii. මෙම ප්‍රදර්ශනයේ විවිධ අලංකාරයට මැටි බඳුන් සකස් කර තිබුණි. මැටි භාණ්ඩ නිෂ්පාදනය කළ හැක ක්‍රම 02 ක් නම් කරන්න.

ix. ප්‍රදර්ශන කුටියේ මුළු භාවිතයෙන් කල නිර්මාණ ද තිබුණි. වූල් වලින් කළ හැකි නිර්මාණ 04 නම් කරන්න.

x. පාසල් භූමිය අලංකාර කිරීමට සිසුන් විසින් විවිධ තැන්වල මූර්ති සකස් කර තිබුණි. මූර්ති සෑදීමට භාවිතා කළ හැකි මාධ්‍ය 02 ක් ලියන්න. (ලකුණු 2x10=20)

(02) ජ්‍යාමිතික නිර්මාණ ප්‍රමිතියෙන් යුත් සැලසුම් සහගත භාණ්ඩයක් නිෂ්පාදනයේදී යොදා ගැනේ.

i. ජ්‍යාමිතික ඝන රූප 04 ක් නම් කරන්න. (ල.02)

ii. අරය 2 cm යුත් වෘත්තයක් තුළ සවිධි පංචාස්‍රයක් නිර්මාණය කරන්න. (ල.04)

iii. 4 cm විෂ්කම්භය ඇති උස 6 cm වන සිලින්ඩරයක විකසනය අඳින්න. (ල.04)

(03) අතීතයේත්, වර්තමායේත් රෙදි වියීම සඳහා විවිධ යන්ත්‍ර භාවිතා කර තිබේ.

i. රෙදි විවීමේ යන්ත්‍ර වර්ග 02 ක් ලියන්න. (ල.02)

ii. හිරි වියමනේ ප්‍රභේද 04 ක් නම් කර එක් වියමනක මතුපිට ඇඳ දක්වන්න. (ල.04)

iii. අත් පිස්නා නූල් හැදයක විස්තරයක් පහත දැක්වේ. හාදයේ දිග මීටර් 80 යි. පළල සෙන්ටිමීටර් 40 යි. සෙන්ටිමීටරයකට දික් නූල් 15 යි. නූල් අංකය $\frac{2}{30}$ s වේ.
ඉහත විස්තරය අනුව හැදයට අවශ්‍ය දික් නූල් ප්‍රමාණය සොයන්න. (ල.04)

(04) ස්වභාවික හා කෘත්‍රිම කෙඳි මගින් රෙදි නිෂ්පාදනය කරයි.

i. ස්වභාවිකව කෙඳි ලබාගත හැකි ශාක හා සත්ව වර්ග 02 ක් ලියන්න. (ල.02)

ii. රෙදි පිළි අලංකරණය සඳහා භාවිතා කරන මුද්‍රණ ක්‍රම 04 ක් නම් කර ඔබ කැමති ක්‍රමයකට මෝස්තරයක් අඳින්න. (ල.04)

iii. බතික් නිර්මාණයක් සකස් කිරීමේදී අනුගමනය කළ යුතු පියවර නම් කරන්න. (ල.04)

(05) මැටි භාවිතයෙන් භාණ්ඩ නිෂ්පාදනය කිරීම අද වන විට වර්ධනය වී ඇත.

i. අච්චු තැනීමට ප්ලාස්ටර් බෆ් පැරිස් භාවිතා කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 02 ක් ලියන්න. (ල.02)

ii. සාදන ලද මැටි භාණ්ඩ දෙවන පිළිස්සීමට හෙවත් ග්ලෙස් (Glaze) යෙදීම මගින් ලබාගත හැකි ප්‍රයෝජන 04 ක් ලියන්න. (ල.04)

iii. ප්ලාස්ටර් ඔෆ් පැරිස් භාවිතා කර සරල අච්චුවක් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය ලියා එය සාදා ගන්නා ආකාරය ලියන්න. (ල.04)

(06) ස්වාභාවික මෙන්ම කෘතිම ද්‍රව්‍ය භාවිතා කර මිනිසා සෙල්ලම් සතුන්, විවිධ මල් සැරසිලි හා විවිධ විසිතුරු දෑ නිර්මාණය කරයි.

i. ස්වභාවික මල් කල්තබා ගැනීමේ ක්‍රම 02 ක් නම් කරන්න. (ල.02)

ii. ඔබ කැමති මාධ්‍යයකින් ආභරණයක් නිර්මාණය කර ගන්නා ආකාරය විස්තර කරන්න. (ල.04)

iii. රෙදි කැබලි ආශ්‍රිත බෝනික්කෙකු නිර්මාණය කර ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය ලියා සාදාගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල.04)

(07) අතීතයේ සිට ම මිනිසා පරිසරය අලංකාර කිරීම සහ උද්‍යාන අලංකරණය පිළිබඳ උනන්දුවක් දක්වා ඇත.

i. පරිසරය අලංකාර කිරීමෙන් ඇති ප්‍රයෝජන 02 ක් ලියන්න. (ල.02)

ii. උද්‍යාන විද්‍යා මූලධර්ම 04 ක් නම් කර එයින් දෙකක් කෙටියෙන් හඳුන්වන්න. (ල.04)

iii. ක්‍රියාකාරී මිනිස් ඉරියව්වක් නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලියා එය සාදා ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල.04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 3 ) | 02. ( 1 ) | 03. ( 3 ) | 04. ( 4 ) | 05. ( 1 ) | 06. ( 2 ) | 07. ( 3 ) | 08. ( 2 ) | 09. ( 1 ) | 10. ( 2 ) |
| 11. ( 3 ) | 12. ( 4 ) | 13. ( 4 ) | 14. ( 1 ) | 15. ( 3 ) | 16. ( 1 ) | 17. ( 1 ) | 18. ( 4 ) | 19. ( 3 ) | 20. ( 1 ) |
| 21. ( 4 ) | 22. ( 2 ) | 23. ( 3 ) | 24. ( 2 ) | 25. ( 1 ) | 26. ( 1 ) | 27. ( 3 ) | 28. ( 2 ) | 29. ( 4 ) | 30. ( 4 ) |
| 31. ( 3 ) | 32. ( 2 ) | 33. ( 4 ) | 34. ( 1 ) | 35. ( 2 ) | 36. ( 3 ) | 37. ( 1 ) | 38. ( 2 ) | 39. ( 3 ) | 40. ( 1 ) |

## II පත්‍රය

(01) i. කෙසෙල් කොළ, කිතුල් රැහැන්, ගොක් කොළ ආදිය
ii. වියළා ගත් මල්, කොළ, ස්වභාවික ඇට වර්ග ආදිය
iii. කළු ගල්, සිමෙන්ති, ජලය, විසිතුරු පැළ වර්ග, මල් වර්ග ආදිය
iv. පින්තාරු, කොලප් නිර්මාණ, වියළි මල් කොළ ඇලවීම, එම්බෝස් ආදිය
v. පින්තාරු, ස්ටෙන්සිල්, අච්චු, තිරරාමු, බතික් ආදිය
vi. සුදුසු හැඩතල දෙකක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
vii. මල් වර්ග, කෙළ වර්ග, මල් පෝච්චි ආදිය
viii. ඇඹීම, තහඩු, දරඬු, අච්චු ආදිය
ix. ළදරු ඇඳුම්, බිත්ති සැරසිලි, මේස රෙදි, බෑක් ආදිය
x. සිමෙන්ති, පල්ප, මැටි ආදිය (ලකුණු 2x10=20)

(02) i. සිලින්ඩරය, ඝනකය, ඝනකාභය, ප්‍රිස්මය, කේතුව, පිරමීඩය ආදිය. (ල.02)
ii. නිවැරදිව ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)
iii. සිලින්ඩරයේ නිවැරදි මිම් සහිතව ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

(03) i. චාම් යන්ත්‍රය, ජවනඩා යන්ත්‍රය, යුටිලිටි යන්ත්‍රය ආදිය (ල.02)
ii. සරල හීරි, දඟරහීරි, රළ හීරි, රුචිත හීරි ආදියෙන් 2 ක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)
iii. දික් නූල් ප්‍රමාණය $= \frac{40 \times 40 \times 15}{1000 \times 15}$

$= \frac{16}{5}$

$= 3.2$ kg (ල.04)

(04) i. ශාක - කජු, ලිනන, රැමී, ෆයිනා, සිසිල්, හණ ආදිය

සත්ව - බැටළුවා, එළුවා, පටපණුවා, ඔටුවා ආදිය (ල.02)
ii. ස්ටෙන්සිල්, අච්චු මුද්‍රණය, තිර රාමු, සේද රාමු අදාය අදාළ රූප සටහනක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)
iii. නිවැරදි ලෙස පියවර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

(05) i. ප්ලාස්ටර් ඔෆ් පැරිස් කුඩු භාවිතයට ගැනීමේදී දවටනය විවෘතව නොතිබීමට වගබලා ගැනීම.
ජලය මතට ක්‍රමයෙන් ප්ලාස්ටර් ඔෆ් පැරස් දමා දිය කරගත යුතුය.
කල් ඉකුත් වූ කැටි ගැසුණු ඒවා භාවිතයට නොගත යුතුය. (ල.02)
ii. 
- ඔප දැමූ භාණ්ඩවලට දිය උරා නොගනියි.
- උෂ්ණත්වයට ඔරොත්තු දෙයි.
- ශක්තිමත් ය.
- කල්පවතියි.
- කලාත්මක බව (ල.04)

iii. ද්‍රව්‍ය ලැයිස්තුව ලියා පියවර ලෙස අච්චුව සාදා ගන්නා ආකාරය ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

(06) i. 
- තෙත පුළුන් එතීම.
- ඇස්ප්‍රීන් මිශ්‍ර ජලයේ දමා තැබීම.
- සබන් මිශ්‍ර ජලය දමා තිබීම. (ල.02)

ii. කැමති මාධ්‍යයකින් ආභරණයක් සාදා ගන්නා ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)
iii. අවශ්‍ය ද්‍රව්‍ය ලියා සාදාගන්නා ආකාරය ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

(07) i. 
- මානසික සුවය ලැබීම.
- පිරිසිදු වාතාශ්‍රය ලැබීම.
- සිත් ඇඳ ගන්නා සුළු වීම. (ල.02)

ii. සමබරතාවය, අවකාශය, අනුපාතය, විවිධත්වය, කැපී පෙනෙන සුළු බව ආදිය ලියා 02 ක් විස්තර කර ඇත්නම්. (ල.04)
iii. මිනිස් ඉරියව්වට අවශ්‍ය ද්‍රව්‍ය ලැයිස්තුව ලියා සාදාගන්නා ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න.(ල.04)